ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**University of Sri Jayewardenepura**

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
**External Degrees and Extension Courses Unit**

# විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම

## 2024 සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි I පරීක්ෂණය (නව/පැරණි විෂය නිර්දේශය) 2026 පෙබරවාරි/මාර්තු (2017/2018/2019/2020/2021/2022 සහ 2023 පුනර් කණ්ඩායම් ද ඇතුලත් වේ)

**2026 පෙබරවාරි 14 දින සිට ආරම්භ වීමට නියමිත උක්ත පරීක්ෂණයට අදාළ විභාග ප්‍රවේශ පත්‍රය මේ වන විට ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) වෙත පිවිස බාගත (Download) කරගත හැක.**

**ඔබගේ ප්‍රවේශ පත්‍රයේ සඳහන් මධ්‍යස්ථාන කේතය (Center Code) අනුව පහත දක්වා ඇති මධ්‍යස්ථාන වලදී පරීක්ෂණ සඳහා පෙනී සිටිය යුතුය**

| මධ්‍යස්ථාන කේතය Center Code | විභාග මධ්‍යස්ථානය Exam Centre |
|---|---|
| 264 | බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, නො 16, එස්. ඩී. එස්. ජයසිංහ මාවත, කොහුවල<br>External Degrees and Extension Course Unit, No. 16, S. D. S. Jayasinghe Mawatha, Kohuwala. |
| 263 | SBTF ප්‍රධාන ශාලාව, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය<br>SBTF Main Hall, Faculty of Management Studies & Commerce, USJP |

## අපේක්ෂකයන් සඳහා පොදු උපදෙස්

- විභාග ප්‍රවේශපත්‍රයට යොදන අත්සන ඔබගේ බාහිර අපේක්ෂක සටහන් පොතේ අත්සනට සමාන විය යුතුය. එසේ නොවුනහොත් එය විභාග අක්‍රමිකතාවයක් සේ සලකනු ලැබේ.
- පරීක්ෂණය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථම විභාග ප්‍රවේශ පත්‍රයේ සඳහන් විභාග මධ්‍යස්ථානයට පැමිණිය යුතුය.
- **පරීක්ෂණය සඳහා සහභාගී වීමේදී අත්සන සහතික කරන ලද විභාග ප්‍රවේශ පත්‍රය සහ ශිෂ්‍ය වාර්තා පොත රැගෙන පැමිණීම අනිවාර්ය වන අතර එසේ නොමැති අපේක්ෂකයන්ට පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.**
- විභාග පැවැත්වීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන නීති රීති ඇතුලත් පොත (By-Law) external.sjp.ac.lk/exam-rules-and-regulations-guide/ වෙබ් අඩවියෙහි පල කර ඇත. ඒ සම්බන්ධයෙන් දැනුවත්ව පැමිණීම අනිවාර්ය වේ.
- විභාගය සඳහා පෙනී සිටින අවස්ථාවේදී ඔබට හදිසි රෝගී තත්ත්වයක් ඇති වුවහොත් වහාම විභාග නිරීක්ෂක නිලධාරියෙකුට හෝ විභාග ශාලාධිපතිට දැන්විය යුතුය.
- **විභාග අපේක්ෂකයන්ගේ දෙමාපියන් හෝ භාරකරුවන් විභාග මධ්‍යස්ථානය අසලට පැමිණීමෙන් වැළකිය යුතු අතර විභාග මධ්‍යස්ථාන පරිශ්‍රය තුලට කිසිදු වාහනයක් ඇතුළු නොකළ යුතුය.**
- විභාග මධ්‍යස්ථානය තුල විභාග ශාලාවලින් පිටත වෙනත් පරිශ්‍රවලට අනවශ්‍ය පරිදි ගමන් කිරීමෙන් වැළකිය යුතුය.
- විභාග මධ්‍යස්ථාන පරිශ්‍රය තුල අපද්‍රව්‍ය බැහැර කිරීමට පහසුකම් සලසා ඇති ස්ථානවලට හැර වෙනත් කිසිඳු ස්ථානයකට අපද්‍රව්‍ය බැහැර නොකල යුතුය.

**<u>බාහිර උපාධි පරීක්ෂණ සඳහා නොපැමිණීමට හේතු/වෛද්‍ය වාර්තා/Absence Justification Form ඉදිරිපත් කිරීම සඳහා උපදෙස්</u>**

1. මෙම පරීක්ෂණය සඳහා පළමුවර පෙනී සිටින **<u>2024 ශිෂ්‍ය කණ්ඩායමේ අපේක්ෂකයන්ට</u>** සහ **<u>2023 අධ්‍යයන වර්ෂයේ උපාධි I පරීක්ෂණය සඳහා වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර අනුමත වූ අපේක්ෂකයන්ට (ප්‍රතිඵල ලේඛනයේ MC සහිත)</u> <u>පමණක්</u>** මෙවර පරීක්ෂණයට පෙනී නොසිටියේ නම් පහත පරිදි වෛද්‍ය වාර්තා ඉදිරිපත් කළ හැකිය. **පරීක්ෂණයට අයදුම් නොකර වෛද්‍ය වාර්තා ඉදිරිපත් කිරීම වලංගු නොවේ.** පහත දක්වා ඇති 428 සනාතන සභාව විසින් අනුමත කරන ලද කරුණු හොඳින් කියවා මුළු විභාගය හෝ අදාළ විභාග කොටස නිම වී **දින 14 ක් ඇතුළත** වෛද්‍ය වාර්තා ඉදිරිපත් කළ යුතුය.

**<u>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ</u>**
**<u>428 වැනි සනාතන සභාව විසින් අනුමත කරන ලද විශේෂ කරුණු</u>**
**<u>පරීක්ෂණයට පෙනී නොසිටීම සම්බන්ධයෙන් වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම</u>**

**බාහිර අපේක්ෂකයන් සඳහා**

- රෝගී තත්ත්වයක් නිසා මුලු විභාගය හෝ විභාගයේ අදාළ කොටසකට හෝ පෙනී නොසිටින බාහිර විභාග අපේක්ෂකයන් එම හේතුව සනාථ කරමින් සාක්ෂි සමග තමා පදිංචි ප්‍රදේශයේ රජයේ ආරෝග්‍ය ශාලාවකින් ලබා ගත් වලංගු වෛද්‍ය සහතිකයක් පෙනී සිටීමට නොහැකි වූ මුළු විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී **දින 14ක් ඇතුළත** බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

- පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර කරනු ලබන රජයේ පිළිගත් බටහිර, ආයුර්වේද හෝ හෝමියෝපති වෛද්‍යවරුන්ගෙන් ප්‍රතිකාර ලබාගන්නා අපේක්ෂකයෙකු තමා ලබාගත් වෛද්‍ය සහතිකය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී හමු වී ඔහු ලවා සහතික කරවා ගත යුතු ය. එම සහතිකය පෙනී සිටීමට නොහැකි වූ විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී **දින 14ක් ඇතුළත** බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී/විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

2. බාහිර උපාධි පරීක්ෂණ සඳහා නොපැමිණීමට හේතු /වෛද්‍ය වාර්තා/Absence Justification Form ඉදිරිපත් කිරීමට අපගේ external.sjp.ac.lk යන වෙබ් අඩවියෙහි ඇති අයදුම්පත (සිංහල හෝ ඉංග්‍රීසි යන ඕනෑම මාධ්‍යයකින්) බාගත කරගෙන නිවැරදිව සම්පූර්ණ කර වෛද්‍ය වාර්තාව සමග අමුණා **නියෝජ්‍ය ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.** (ඡායා පිටපත් ළඟ තබාගන්න) **වෙනත් කිසිඳු ආකාරයකින් භාරදීම සිදු නොකළ යුතුය.**



නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2026.02.06